ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1882/23 - 2014 ඔක්තෝබර් මස 01 වැනි බදාදා - 2014.10.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/1978(Xii).

### 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත

### 27(1) වැනි වගන්තිය යටතේ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වැනි වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, උසස් අධ්‍යාපන අමාත්‍ය, දිසානායක මුදියන්සේලාගේ සුමනවීර බණ්ඩා දිසානායක වන මම, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය මත මේ නියමය මගින් (2010 ජුනි මස 17 වැනි දින අංක 1658/36 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය මගින් අවසන් වරට සංශෝධිත) එකී පනතේ 139 වැනි වගන්තියේ විධිවිධාන ප්‍රකාර, ඉහත කී පනතේ 21 වැනි වගන්තිය යටතේ සාදන ලද නියමයක් ලෙස සලකනු ලැබිය යුතු සහ කොළඹ විශ්ව විද්‍යාලය පිහිටුවනු ලැබූ නියමයේ උපලේඛනයේ I වැනි තීරයේ පීඨය යන ශීර්ෂය යටතේ දැක්වෙන "කළමනාකරණ සහ මූල්‍ය පීඨය" යන අයිතමයට අනුරූපව එම උපලේඛනයේ II වැනි තීරයේ "අධ්‍යයන අංශ" යන ශීර්ෂය යටතේ දැක්වෙන සියලුම අයිතම ඉවත්කර පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්, එම නියමයේ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ -

| "I වැනි තීරය | II වැනි තීරය |
|---|---|
| පීඨය | අධ්‍යයන අංශ |
| කළමනාකරණ සහ මූල්‍ය පීඨය | 1. ගිණුම්කරණ අධ්‍යයන අංශය<br>2. ව්‍යාපාර ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය<br>3. මූල්‍ය අධ්‍යයන අංශය<br>4. මානව සම්පත් කළමනාකරණ අධ්‍යයන අංශය<br>5. කළමනාකරණ හා සංවිධාන අධ්‍යයන අංශය<br>6. අලෙවිකරණ අධ්‍යයන අංශය<br>7. ජාත්‍යන්තර ව්‍යාපාර අධ්‍යයන අංශය.". |

දිසානායක මුදියන්සේලාගේ සුමනවීර බණ්ඩා දිසානායක,
උසස් අධ්‍යාපන අමාත්‍ය,

2014 සැප්තැම්බර් මස 26 වැනි දින,
කොළඹ දී ය.

10 - 669

1A - PG 2183 — 500 (2014/10) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.